ලේඛ අංක: 08/2010

ම 10/විවිධ/පොදු/2010


තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

No

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488 / 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: rgd@sltnet.lk / rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகம் திணைக்களம்

REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

වෙබ් අඩවිය / இணைய தளம் / Web site: www.rgd.gov.lk

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Baththaramulla'


දිනය / திகதி / Date: 2010/10/6

සියළුම විවාහ (සාමාන්‍ය/උඩරට) රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## බාලවයස්කරුවන්ගේ විවාහ ලියාපදිංචි කිරීම

මේ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද සියළුම චක්‍රලේඛ හා උපදෙස්වලට අමතර වශයෙනි.

02. 1995 අංක 18 දරණ පනතින් සංශෝධිත සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 15 වන වගන්තිය අනුවද, 1995 අංක 19 දරණ පනතින් සංශෝධිත උඩරට විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වන සහ 66 වන වගන්ති අනුව ද, විවාහ අපේක්ෂකයන් විවාහය ලියාපදිංචි කිරීම සඳහා සම්පූර්ණ කළයුතු වයස අවුරුදු 18 ලෙස සංශෝධනය කර ඇත.

03. එසේ වුවද සමහර රෙජිස්ට්‍රාර්වරුන් විසින් බාල වයස්කරුවන්ගේ විවාහ ලියාපදිංචි කිරීමද, ඔවුන්ගේ අනන්‍යතාවය හෝ වයස පිළිබඳ සැලකිලිමත් නොවීමද, පිළිබඳ තොරතුරු මා වෙත වාර්තා වේ. මෙය අවලංගු විවාහ සිදු කිරීමටත්, සමාජගත විවිධ ගැටලුවලට තුඩු දෙන සමාජ සම්බන්ධතා ඇතිවීමටත් ප්‍රබල හේතුවක් වී ඇත. මෙබඳු විවාහ මගින් රෙජිස්ට්‍රාර් තනතුර මෙන්ම මුළු දෙපාර්තමේන්තුව ද අපකීර්තියට පත් වේ.

04. ඒ අනුව විවාහ දැන්වීම් භාර දීමට/විවාහ ලියාපදිංචි කිරීමට පැමිණෙන සියළුම පාර්ශ්වකරුවන්ගේ අනන්‍යතාවය හා වයස සනාථ කර ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්වරුන් විසින් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත හා/හෝ උප්පැන්න සහතිකය, වලංගු ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය ආදි පිළිගත හැකි ලේඛන පරීක්ෂාකර බැලීම අනිවාර්ය වේ.

ඇ.පි.බ.

05. උක්ත ලේඛන ඉදිරිපත් නොකරන අවස්ථාවකදී හෝ එම ලේඛන සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි අවස්ථාවක දී, මේ සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර, ග්‍රාම නිලධාරී විසින් සහතික කළ හා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තැබූ, වයස හා අනන්‍යතාවය පිළිබඳ සහතිකයක් ලබාගත යුතුය. වයස හා අනන්‍යතාවය තහවුරු කර ගැනීමට උපයෝගී කරගත් ලේඛන/පිටපත් විවාහ දැන්වීමට ඇමිණිය යුතු වන අතර මේ සඳහා ව්‍යාජ ලේඛන උපයෝගීකර ගත්තේ නම්, ඒ පිළිබඳ වගකීම රෙජිස්ට්‍රාර්වරයා විසින් දැරිය යුතු වේ.

06. බාලවයස් විවාහ සිදුකිරීම අනාවරණය වුවහොත් විධිමත් විනය පරීක්ෂණයකින් තොරව මූලික විමර්ශණයක් පමණක් පදනම් කරගෙන, වරදකරුවන් වන රෙජිස්ට්‍රාර්වරුන් තනතුරෙන් පහ කිරීමටත්, විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ඔස්සේ දඬුවම් පැමිණවීමටත් කටයුතු කරන බව දන්වමි.

07. මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

**ඊ. එම්. ගුණසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්**

පිටපත් ;

| | |
|---|---|
| 1) ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - දැ.ගැ.ස. |
| 2) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් | -දැ.ගැ.ස. |
| 3) සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් | -දැ.ගැ.ස. |
| 4) ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් | -නිරන්තර අධීක්ෂණය සඳහා |
| 5) ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් | -නිරන්තර අධීක්ෂණය සඳහා |
| 6) දිප ව්‍යාප්ත වි.උ.ම. රෙජිස්ට්‍රාර් සංගමය | -දැ.ගැ.ස. |